# කැන්බරා ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය ගැනයි

ප්‍රධාන කර්තෘ තුමා

ප්‍රිය මහත්මයාණෙනි,

කෙටි නිවාඩුවකට ලංකාවේ සිට සිඩ්නි නගරයට පැමිණි මම 2009 ඔක්. 10 දින හෝ ස්වදේශික මිතුරන් තිදෙනෙකු සමඟ කැන්බරා නගරයෙහි ඇති ටියුලිප් මල් දැක්ම නැරඹීම සඳහා ගියෙමි. මල් දැක්ම නැරඹීමෙන් අනතුරුව අප ඕස්ට්‍රේලියා පාර්ලිමේන්තු සංකීර්ණය නැරඹීම සඳහා ගිය අතර එහි වූ නිළධාරීන්ගේ උණුසුම් පිළිගැනීම් මැද පාර්ලිමේන්තු සභා ගැබ ඇතුළු එහි වූ සෑම අංශයක්ම නැරඹීමේ අවස්ථාව ලදිමු. එහිදී මෙම රටෙහි පාලන තන්ත්‍රයෙහි ඇති සරල හා විධිමත් බව වටහාගත් මම මහත් සේ උද්දාමයට පත් වීමි. අනතුරුව මගේ ඉල්ලීම පරිදි මගේ මිතුරන් ශ්‍රී ලංකා මහා කොමසාරිස් කාර්යාලය දැකබලා ගැනීම සඳහා මා කැට්ව යන ලදී. එය ස්ථානගතව තිබුනේ අප සිටි ස්ථානයේ සිට මද දුරකිනි.

ශ්‍රී ලංකාව ගැන මහත් ආඩම්බරයෙන් හා ගරු ගාම්භීරව අප කතා කල නමුත්, ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය ලබා සිටින ලාංකිකයන් ඇතුළු ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව නියෝජනය කරන අපගේ මහ කොමසාරිස් කාර්යාලය වන ගොඩනැගිල්ල දුටුවිටම මට මතක් වූයේ ඈත අතීතයේ අනුරාධපුර/පොළොන්නරුව දිස්ත්‍රික්කවල තිබූ ජරාවාස වූ කච්චේරි ගොඩනැග ිල්ලකටත් වඩා ජරාජීර්ණ වූ දියසෙවිලි හා අවපැහැගත් උළු වහලයකින් යුත්, දුර්වර්ණ සුදු (සුදු පැහැ නොව සුදු මිශ්‍ර මඩ පැහැ) පිරියමින් යුත් නිවසකි. අදෝමැයි ! මෙහි කොඩි කුඹ ගස තිබුණද එහි අපගේ ජාතික ධජය නොවීය. මුරකරුවකු හෝ නොසිටි (පසුව දැනගත් පරිදි මුරකරුවකු නොමැත) මෙම කාර්යාල භූමියේම පිහිටි පැරණි නිවසක සිටි පුද්ගලයෙකුගෙන් මා ජාතික කොඩිය නොමැති කම පිළිබඳව විමසීමේදී ඔහු පැවසුයේ සෙනසුරාදා - ඉරිදා හා අනෙකුත් නිවාඩු දිනවල කොඩිය ගලවා තබන බවයි. ඒ නමුත් කැන්බරා නගරය තුල වූ ඉන්දියාව, නවසීලන්තය, එංගලන්තය, පැපුවා නිව්ගිනියාව, බංග්ලාදේශය යන රටවලට අදාල මහාලේකම් හා තානාපති කාර්යාලවල ඔවුනොවුන්ගේ ජාතික කොඩි ඔසවා තබා ඇති සැටි අපි දුටුවෙමු.

මෙම ක්‍රියා පිළිවෙත මා සමඟ සිටි ස්වදේශික මිතුරන්ටද විශ්මය දනවන්නක් වූ අතර මට සිදුවූයේ මුණිවත රැකීම පමණකි. කොඩි ගසද නිකම්ම නිකම් යකඩ බටයකි. කාර්යාලවල භූමියේ එකදු මල් පැලයක් නොවු අතර එහි භූමිය කර්කෂ වූ බොරළු පස් හා තැන් තැන්වල වූ තණ පිඩලි කිහිපයකින් යුක්ත විය. පාරට පෙනෙන පරිදි දමා තිබූ ගොඩනැගිලිවල ජනෙල් රෙදි අපේ වචනයෙන් කිවහොත් ගොමස්කඩ පාටින් යුක්ත විය. ඒවා අවුරුදු ගණනාවකින් නොසෝදා ඇති බව එහි වූ අව පැහැයෙන් දර්ශනය විය. අපට තොරතුරු දුන් පුද්ගලයාගෙන් දැනගත් පරිදි මෙම කාර්යාල ගොඩනැගිල්ල කලකට පෙර ගැබිණි මාතෘ නිවසක්ව පැවති බව දැන ගැනීමට ලැබුණි. එය සත්‍යයක් විය යුතුය. මන්ද, ලංකාවේ පිහිටි කොළඹ මහ නගර සභාවට අයත් ග්‍රෑන්ඩ්පාස් ගැබිණි මාතෘ නිවාසයද මේ හා සමාන බවකින් යුක්ත වීම නිසාය. මෙම ගොඩනැගිල්ලේ ස්වභාවය කියා පෑමට මීට වඩා උදාහරණයක් නොමැත.

ශ්‍රී ලංකාවේ පිහිටි ඕස්ට්‍රේලියානු මහා කොමසාරිස් කාර්යාලයත්, මෙරටෙහි ඇති මහ කොමසාරිස් කාර්යාලයත් අතර ඇති වෙනස මින් ඔබට පැහැදිලි වනු ඇත. මෙම ආයතනය නඩත්තු කිරීම සඳහා අප රටින් මුදල් නොඑවන්නේද? නොඑසේ නම් එවන මුදල්වලට සිදුවන්නේ කුමක්ද යන්න දත යුත්තේ මහ කොමසාරිස් තුමා පමණී. ඇරත් ලංකාවේ විදේශ කටයුතු ඇමතිතුමා එකවරක් හෝ මෙහි පැමිණ ඇතිද යන්නත් විමසිය යුත්තකි. ඇත්ත වශයෙන්ම අප රට නියෝජනය කරන උත්තරීතර ආයතනයක කාර්යාලය මෙලෙස පවත්වාගෙන යෑම, ඒ දැකීම ශ්‍රී ලාංකික අපට මහත් ලැජ්ජාවකි. ශෝකයකි.

ඕස්ට්‍රේලියාව පුරා ජීවත්වන ශ්‍රී ලාංකික සහෝදර - සහෝදරියන්ගෙන් මා ඉල්ලා සිටිනුයේ මෙම ලිපියේ සත්‍ය අසත්‍යතාවය දැන ගැනිමට එක් වරක් හෝ කැන්බරා නුවරට පැමිණ මෙම ස්ථ ානය දැකබලා ගන්නා ලෙසටයි. එමෙන්ම ඔබ පුවත්පත මගින් මෙම තොරතුරු ශ්‍රී ලාංකික පාඨකයින් වෙත යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. ඔබ සැමගෙන් මා ඉල්ලා සිටිනුයේ මෙහි යථාර්ථය දැක බලා ඒ සම්බන්ධයෙන් අපගේ අතිගරු ජනාධිපතිතුමා දැනුවත් කිරීමේ කාලය දැන් එළඹී ඇති බවයි. සමහරවිට මෙවන් තොරතුරු එතුමා නොදන්නවා විය හැකිය.

මෙයට විශ්වාස වූ

සූරියවංශ ජයසේකර



**Recently 10,000 note books were donated to Sri Lanka Prime Minister Rathnasiri Wicramanayake from Lion Lieutenant Commander Ruwan Paul & Lion Lidia Paul Director of Australian International Migration Consultant Pty Ltd at the Prime Minister's office in Colombo Sri Lanka. This donation was towards School kids in Sri Lanka**




# Get
## 3 Certificates for the Price of 1

- Aged Care (Certificate III) - CHC30102
- Home & Community Care (Certificate III) - CHC30202
- Disability Work (Certificate IV) - CHC40302
- First Aid (Apply) - HLTFA301B

When you study with JTI you get:

- Face to face Classroom, Online & Correspondence
- Faster Qualification via Blended Learning
- Flexible weekday & weekend classes (Day & Evening)
- Trainer support via phone, email, chat and face-to-face
- Free assistance with work placement
- Prior Learning Experience Program (RPL) & Credits.

JTI
Job Training Institute
www.jobinstitute.com.au
qld@jobinstitute.com.au
RTO#22208 ABN 49 132 734 680

Address: 1374 Logan Rd, Mt. Gravatt, Qld 4122
PH: 1300 831 661 | 0422 741 226